රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: **(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** / Web Site

මගේ අංකය / எனது இல / My No } CS/DOS/Policy/පොදු/01
ඔබේ අංකය / உமது இல / Your No }
දිනය / திகதி / Date } 2020.06.01

දිස්ත්‍රික් ලේකම්,

...................................

**<u>සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම.</u>**

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012 (III) හි විධිවිධාන අනුව සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීම් හා සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ගේ ශ්‍රේණිගත උසස් කිරීම් කඩිනමින් අවසන් කිරීම.</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද පහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

| | <u>චක්‍රලේඛ අංකය</u> | <u>නිකුත් කළ දිනය</u> |
|---|---|---|
| I. | 10/2012 | 2012.05.08 |
| II. | 10/2012 (I) | 2012.06.21 |
| III. | 10/2012 (II) | 2016.04.04 |
| IV. | 10/2012 (III) | 2017.08.14 |

02. සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ 14 වන ඡේදයේ දක්වා ඇති පරිදි 2011.08.01 දිනට මධ්‍යම රජයේ සේවයේ යෙදී සිටි නිලධාරීන්ට සහ MN4-2006 (ඒ) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන උපාධිධාරී තනතුරක 2011.08.01 දිනට පළාත් රාජ්‍ය සේවයේ නිරතව සිටි හා පසුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2010(1) අනුව මධ්‍යම රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයට ස්ථාන මාරු වී පැමිණ සේවයේ නිරතව සිටි නිලධාරීන්ට සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කළ හැකි අවසාන දිනය 2017.09.30 වූ අතර, මේ වනවිට එසේ මනාපය පළ කළ නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු අවසන් වෙමින් පවතී.

03. මෙම අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු වඩා සැලසුම්සහගතව කඩිනමින් අවසන් කිරීමේ හා 2011.08.01 දිනට පෙර බඳවා ගෙන ඇති ඉහත කී නිලධාරීන්ගේ ස්ථිර කිරීම්, ශ්‍රේණිගත උසස් කිරීම්

කඩිනමින් සිදු කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන ඔබ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු, [එහෙත් වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වලට අනුයුක්තව ඔබ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ /ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු වූවන් හැර] සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කළ සියලු නිලධාරීන්ට අදාල තොරතුරු රැස් කිරීමට තීරණය කර ඇත.

04. ඉහත 02 ඡේදය සඳහන් පරිදි සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා 2017.09.30 දිනට පෙර මනාපය පළ කරන ලද, සියලු නිලධාරීන්ගේ තොරතුරු මේ සමඟ අමුණා ඇති ආකෘතිය [CS/DOS/Abs/Inf/2020] ප්‍රකාරව සකස් කර එහි දෘඩ පිටපත 2020.07.30 දිනට පෙර ලැබෙන සේ හා මෘදු පිටපත විද්‍යුත් තැපැල් ලිපින adcs1-dos@pubad.gov.lk ඔස්සේ හැකි ඉක්මණින් මා වෙත ලැබීමට සලස්වන ලෙස කාරුණිකව දන්වමි.(මෙම ලිපිය මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ රාජ්‍ය පරිපාලන අංශය යටතේ වන සංවර්ධන නිලධාරී සේවයට අදාළ පිටුවෙහි විශේෂ නිවේදන යටතේ දක්වා ඇති අතර CS/DOS/Abs/Inf/2020 ආකෘතියද ඔබට බාගත කිරීමේ හැකියාව ඇත. මෙම ආකෘතිය අනුසාරයෙන්ම තොරතුරු ඉදිරිපත් කළ යුතු අතර තොරතුරු ඇතුළත් කිරීමේදී අනුමත අකුරු (Font : Iskola Potha ) සහ ප්‍රමාණය (Font Size : 12) භාවිතා කළ යුතුය.)

05. සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණයවීමට ඉහත චක්‍රලේඛ විධිවිධාන යටතේ දැනටමත් මනාපය පළ කර ඇති නිලධාරීන්ට එම ඉල්ලීම් නැවත ඉල්ලා අස්කර ගැනීමට අවස්ථාව නොමැති බව අවධාරණය කරන අතර සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන් සම්බන්ධ ආයතනික කටයුතු විධිමත් කිරීම පිණිස නියමිත දිනට පෙර තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

06. තවද, මෙම කටයුතු සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියකුද නම් කර ඔහු/ඇය සෘජුවම සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකයක්ද සඳහන් කර එවන ලෙස දන්වන අතර තොරතුරු ලැබෙන අනුපිළිවෙළ අනුව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු ඉහත කී නිලධාරීන්ගේ ආයතනික කටයුතු සිදු කිරීමට ප්‍රමුඛත්වය ලබා දෙන බව වැඩිදුරටත් දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්